250026
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
රජයේ ලේඛනාරක්ෂක කාර්යාලය
14-6-1994
ශ්‍රී ලංකා SRI LANKA


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 805/14–1994 පෙබරවාරි 11 වැනි සිකුරාදා–1994.02.11

805/14 ஆம் இலக்கம் — 1994 ஆம் ஆண்டு பெப்புருவரி மாதம் 11 ஆம் திகதி வெள்ளிக்கிழமை

No. 805/14 – FRIDAY, FEBRUARY 11, 1994

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)


## IV (අ) වැනි කොටස–පළාත් සභා

### පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාත් සභාව**

1993 අංක 01 දරන මධ්‍යම පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන පිළිබඳ ඇමති විරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා දිසානායක වන මම, මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 01 දරන මධ්‍යම පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය 1991.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යයි මෙයින් නියම කරමි.

ඩබ්ලිව්. ඩී. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය සහ සාමය,
ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන කටයුතු
පිළිබඳ අමාත්‍ය.

1994 පෙබරවාරි මස 03 වැනි දින,
මහනුවර දී ය.

**1993 අංක 01 දරන මධ්‍යම පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය**

***1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.***

මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1993 අංක 01 දරන මධ්‍යම පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. 1990 අංක 17 දරන මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය 1982 අංක 43 දරන "මුද්දර ගාස්තු පනතේ ඇතැම් විධිවිධානවලට අනනුකූල වේ" යන වචනය ඉවත්කොට ඒ වෙනුවට 1982 අංක 43 දරන "මුද්දර ගාස්තු පනතේ සහ සංශෝධිත පරිදි වූ සුරාබදු පනතේ සහ සංශෝධිත පරිදි වූ මහ නගර සභා ආඥාපනතේ සහ සංශෝධිත පරිදි වූ නගර සභා ආඥාපනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ඇතැම් විධිවිධානවලට අනනුකූල වේ" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ. *1990 අංක 17 දරන මධ්‍යම පළාත් මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

1A – CP 019949 – 1,110 (94/01)

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂාව බලපැවැත්විය යුතු බව.

3. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වූ විටක සිංහල භාෂා පාඨය බල පවත්වන්නේ ය.